ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 97/78.

## ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනතේ 6 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි "එක් එක් තුන් මස් කාල සීමාව තුළ යටත් පිරිසෙයින්" යන වචන වෙනුවට "සෑම ලිත් වර්ෂයක් තුළ ම යටත් පිරිසෙයින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇ) නිර්මාපණය කරනු ලැබූ දින සිට අවුරුදු විසි පහකට නොඅඩු කාලයක් ගත වී ඇති ලේඛනයක් වන්නා වූ ද ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා ජාතික ලේඛනාගාරය වෙත පැවරිය යුතු බවට අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන්න වූ ද යම් ලේඛනයක් ජාතික ලේඛනාගාරයට පැවරීම;".

9අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියෙහි 9අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"ජනාධිපති ලේඛනාගාර අංශය සහ ආශ්‍රය සේවාව.

9අ. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද—

(අ) ශ්‍රී ලංකාවේ ජනරජයේ ජනාධිපතිවරයකුගේ ධුර කාලය ඉකුත් වූ විට, ජනාධිපති කාර්යාලයේ ඇති සියලු පොදු ලේඛන සහ වෙනත් මුද්‍රිත දේ ජාතික ලේඛනාගාරයට පැවරීම ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයාගේ ලේකම්වරයාට අයත් කාර්යය විය යුතු ය.

(ආ) අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුත්තේ—

(i) පහත සඳහන් දේ ජනාධිපති ලේඛනාගාර අංශයේ තැන්පත් කිරීම ය:—

(අ) (අ) ඡේදය යටතේ ජාතික ලේඛනාගාරයට පවරනු ලබන සියලු පොදු ලේඛන හා මුද්‍රිත දේ; සහ

(ආ) ත්‍යාගයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ජාතික ලේඛනාගාරයට ලැබෙන් නා වූ ද ජනාධිපතිවරයකු ගේ හෝ හිටපු ජනාධිපති වරයකුගේ නිල කාර්යවල හෝ පෞද්ගලික ජීවිතයේ හෝ වැදගත් සිද්ධියකට අදාළ වූ ද සියලු ලියකිය විලි සහ ලේඛන, ප්‍රවෘත්ති බණ්ඩ, කාන්දම් පටි, තැටි, ඡායා රූප හෝ වෙනත් දේ; සහ

(ii) (i) වන අනුඡේදයේ සඳහන් පොදු ලේඛන, මුද්‍රිත දේ, ලේඛන සහ ද්‍රව්‍ය උපයෝගී කරගෙන ආශ්‍රය සේවාවක් පිහිටුවීම; සහ

(iii) (i) වන අනුඡේදයේ සඳහන් එවැනි යම් පොදු ලේඛන, මුද්‍රිත දේ, ලේඛන සහ ද්‍රව්‍ය පදනම් කරගෙන වාර්තා සපයන ලෙස ජනාධිපති වරයා විසින් නියම කරනු ලැබූ විට, ඒ වාර්තා ජනාධිපතිවරයා වෙත සැපයීම. "

*ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) ඓතිහාසික, සංස්කෘතික, සාහිත්‍යයික, ආර්ථික හෝ විද්‍යාත්මක වටිනාකමක් ඇති හෝ වෙනත් අයුරකින් ජාතික වැදගත්කමකින් යුත් අවුරුදු පනහකට වඩා පැරණි යම් අත් පිටපතක් හෝ ලේඛනයක්, යම් පුද්ගලයකු සන්තකයෙහි හෝ යම් ආයතනයක සන්තකයෙහි තිබෙන අවස්ථාවක, ඒ පුද්ගලයා විසින් හෝ ඒ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින්, එකී ලේඛනය හෝ අත් පිටපත පවතින බව අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු අතර ඒ ලේඛනයේ හෝ අත් පිටපතේ අයිතිය හෝ සන්තකය වෙනස් වුවහොත් ඒවායේ අලුත් අයිතිකරුගේ හෝ සන්තකය දරන්නාගේ නම සහ ලිපිනය, ඒ වෙනස් වීමෙන් මාස තුනක කාල සීමාවක් ඇතුළත, එකී පුද්ගලයා විසින් හෝ විධායක නිලධරයා විසින් අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු ය. ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්ති යෙහි (අ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) මුද්‍රිත වුව ද නොවුව ද, මහජනයාට විකිණීමට හෝ බෙදා දීමට අදහස් කරන ලද්දක් වුව ද නොවුව ද, රහස්‍ය ලෙස සංසරණය විය යුතු බවට අදහස් කරන ලද්දක් වුවද නො වුවද හෝ නිලධරයන් අතර පමණක් සංසරණය වීමට අදහස් කරන ලද්දක් වුව ද නොවුව ද, යම් රජයේ කාර්යාලයකින් නිකුත් කරනු ලබන සෑම වාර්තාවක ම, සෑම ගිණුම් ප්‍රකාශනයක ම සහ අන් සෑම ප්‍රකාශනයක ම පිටපතක්, එය නිකුත් කරන ලද දින සිට, දින තිහක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත යැවීමට ඒ කාර්යාලයේ වගකිව යුතු නිලධරයාගේ ද,".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "සාහිත්‍යයික වටිනාකමක් ඇති" යන වචන වෙනුවට "සාහිත්‍යයික හෝ ආර්ථික හෝ විද්‍යාත්මක වටිනාකමක් ඇති හෝ හෝ අන්‍යාකාරයක ජාතික වැදගත්කමකින් යුත්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "සංස්කෘතික හෝ සාහිත්‍යයික වටිනාකමකින් යුත්" යන වචන වෙනුවට "සංස්කෘතික, සාහිත්‍යයික, ආර්ථික හෝ විද්‍යාත්මක වටිනාකමකින් හෝ අන්‍යාකාරයක ජාතික වැදගත්කමකින් යුත්" යන වචන ආදේශ කිරීමෙන්.—

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (උ) ඡේදයේ "සාහිත්‍යයික වටිනාකමක් ඇති" යන වචන වෙනුවට "සාහිත්‍යයික හෝ ආර්ථික හෝ විද්‍යාත්මක වටිනාකමක් ඇති නැතහොත් අන්‍යාකාරයක ජාතික වැදගත්කමකින් යුත්" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝග යක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.": සහ

(3) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝග යක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් යම් දිනයක සිට පරිච්ඡින්න කරන ලද ලෙස සැලකෙන්නේ ද ඒ දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) ජාතික ලේඛනාගාරයේ තැන්පත් කර ඇති යම් ලේඛනයක්, අත් පිටපතක් හෝ ලියවිල්ලක් දැන දැනම විරූපි කරන, ඒ මත යමක් ලකුණු කරන, එය විච්ඡේදනය කරන හෝ එයට අලාභහානි කරන හෝ බලයක් නොමැතිව එවැනි යම් ලේඛනයක්, අත් පිටපතක් හෝ ලියවිල්ලක් ඉවත් කරන හෝ මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන අනුව නොවන වෙන යම් ආකාරයකින් යම් පොදු ලේඛනයක් විනාශ කරන හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තකු, වරදකරු කරනු ලැබූ විට, බරපතල වැඩ ඇතිව තෙමසකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියෙහි (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල "සහකාර අධ්‍යක්ෂවරයෙක්" යන වචන යෙදෙන සෑම තැනක ම ඒ වෙනුවට "යම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "අධ්‍යක්ෂවරයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"අධ්‍යක්ෂවරයා" යන්නෙන් ජාතික ලේඛනාගාරයේ අධ්‍යක්ෂවරයා අදහස් වන අතර, ජාතික ලේඛනාගාරයේ යම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් ද ඊට ඇතුළත් වේ;';

(2) "ජාතික ලේඛනාගාරය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"ජනාධිපති ලේඛනාගාර අංශය" යන්නෙන්, 9අ වගන්තියෙහි සඳහන් ජාතික ලේඛනාගාරයේ ශාඛා කාර්යාලයක් සහ සුරක්ෂිතාගාරයක් අදහස් වේ;'.